**ශීර්ෂ 140 - පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---------------------------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂ** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| **292** | **සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලා වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 140 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 2015.10.20 |
| 292 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 2015.06.16 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 5,789 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 5,438.5 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 142.7 ක් හා රු.මිලියන 207.8 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 ක් සියයට 22 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 140 | 4,831.9 | 4,689.2 | 142.7 | 3 |
| 292 | 957.1 | 749.3 | 207.8 | 22 |
| **එකතුව** | **5,789.0** | **5,438.5** | **350.5** | 6 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.මිලියන 187.8 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 185.5 ක් උපයෝජනය කර තිබුණු අතර, ඒ අනුව රු.මිලියන 2.3 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 14001 | 10.0 | 9.9 | 4.0 | 5.7 | 30.0 | 17.7 |
| 29201 | 26.0 | 20.6 | 16.0 | 22.4 | 110.0 | 72.8 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ අංක 7002/0000/00/0296/0014/000 දරන ගිණුමෙ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු. 18,000 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 16.15 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0052/000 | 0.15 |
| සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0147/000 | 16.0 |
| **එකතුව** | | **16.15** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂ 140 - පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**3.2 විගණන සාක්ෂි නොවීම**

-------------------------

ස්වයං රැකියා වක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය සඳහා ලංකා බැංකුවේ පවත්වාගෙන යන ඉතිරි කිරිමේ ගිණුමට අදාල පාස්පොත අමාත්‍යාංශයේ නොතිබීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.8,586,709 ක්වූ තැන්පත් මුදලට අදාලවූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

--------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පෞද්ගලික සමාගමකට අදාල විගණන විමසුමකට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 විසර්ජන ගිණුම**

-----------------

**3.4.1 අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුලධන වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කිරිමට ප්‍රමාණවත් අග්‍රිම භාණ්ඩාගාරයෙන් නොලැබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේදී එම වැය විෂයයන්හි ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ක සිට සියයට 30 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 5 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 ක සිට සියයට 88 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) ප්‍රතිපාදන අවශ්‍යතාවයන් කළමනාකාරීත්වය විසින් නිසි පරිදි පුරෝකථනය නොකිරීමේ හේතුව මත වැය විෂයය 04 කට මුදල් රෙගුලාසි 66 මගින් රු.114,100,000 ක ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණු නමුත් එම ප්‍රතිපාදනවලින් රු.66,431,918 ක් ප්‍රයෝජනයට නොගෙන ඉතිරි වී තිබුණි.

**3.4.2 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

දිවිනැගුම ව්‍යාපෘතියේ 2013 අවිච්ඡේද වැඩ සඳහා හා 2014 වර්ෂය සඳහා රු.මිලියන 187.8 ක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට එම මුදල් පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී තිබුණද කාර්යසාධනය පිළිබඳ පසුවිපරමක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

වාහන අනතුරක් සඳහා 2013 මාර්තු 19 දින ලැබී තිබුණු රු.150,000 ක රක්ෂණ ආවරණ මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 14001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට වර්ෂ 1 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.257,716 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අය කරගත යුතු රු.173,096 ක් වූ ණය ශේෂය 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.7 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂයේදී වාහන 04 ක් මිලදී ගෙන තිබුණත්, එය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

**3.8 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මහවැලි පශු සම්පත් සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂා කිරිමේ කාර්ය අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර සමාගම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාවක්ද සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පශු සම්පත් අංශයට අදාළ ප්‍රධාන ව්‍යාපෘති 06 ක් පරීක්ෂා කිරිමට සැලැසුම් කර තිබුණද ඒවා පරීක්ෂා කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයට අදාලව නිකුත් කර තිබුණු අභ්‍යන්තර විගණන විමසුම් 13 ක් සඳහා 2015 මැයි 30 දින වන විටද අමාත්‍යාංශය විසින් පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.9 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශය සතු රු.40,000,000 ක් වටිනා මෝටර් වාහන 08 ක් මාස 06 ක සිට මාස 32 ක් දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම සමීක්ෂණ මණ්ඩල වාර්තාව 2015 මැයි 26 දින ඉදිරිපත් කර තිබුණි.

(ii) 2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතු වාහන 57 ක් පැවතියද සමාලෝචිත වර්ෂය සඳහා වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(iii) සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව අමාත්‍යවරයාගේ කාර්යාලයේ තිබුණු ලැප්ටොප් පරිගණකයක්, ඩිජිටල් කැමරාවක්, රූපවාහිනියක්, ජංගම දූරකතනයක් හා සාමාන්‍ය දූරකතනයක්, හදිසි ලාම්පු 04 ක් ,අන්තර්ජාල උපකරණ 04 ක් හා Handheld detectors 02 ක් ආපසු භාර දී නොතිබුණු අතර එම ඌනතාවයන් පිළිබඳ ගන්නා ලද ක්‍රියාමාර්ග එම වාර්තාවේ දක්වා නොතිබුණි.

(iv) සමීක්ෂණ වාර්තාව අනුව විවිධ අංශ සතු භාණ්ඩ සම්බන්ධයෙන් පවතින අතිරික්තතා 07 ක් හා ඌණතා 21 ක් නිරීක්ෂණය වූ අතර එම ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ග වාර්තාවේ සඳහන් කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් බේරුම් නොකළ වර්ෂයකට අඩුකාලයක සිට පැවැත එන රු.1,364,452,605 ක බැරකම් විය.

## 3.10 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 1,326,255,391 | වැය විෂයයන් 12 කට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 | 418,329 | වාහන 06 ට සිදුවී තිබුණු අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| (i) 2003 ජනවාරි 01 දිනැති අංක 353(5) දරන චක්‍රලේඛය | 40,000,000 | 2014 සැප්තැම්බර් 09 දින වන විට අපහරණය කිරීමට යෝජිතව තිබුණු වාහන 8 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන චක්‍රලේඛය | 10,300,000 | 2010 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත පැවරුණු රැකියා ව්‍යාපෘති සඳහා වතුකරයේ තරුණ තරුණියන්ට ණයදීම පිණිස පිහිටුවා තිබුණු චක්‍රීය අරමුදල මෙහෙයවීම සම්බන්ධයෙන් චක්රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3.11 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | රු. | |
| කොටගල ඩේටෝන් කොටසට ජලය සැපයීම | 200,000 | - | ලිපිගොනුව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| රොසිටා ස්කීම් පාර සංවර්ධනය | 4,787,000 | - | ලිපිගොනුව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| කොටගල ලොක්හීල් කෝවිල් පාර සංවර්ධනය | 4,787,000 | - | ලිපිගොනුව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| ගැමුණුපුර ප්‍රධාන පාර කොන්ක්‍රීට් කිරීම | 1,150,000 | 2013.09.04 | හේතු දක්වා නොතිබුණි. |

**(ආ) ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්**

**--------------------------------------**

අමාත්‍යාංශය විසින් 2014 පෙබරවාරි 18 දින ආරම්භ කර තිබුණු රු.1,102,940 ක් වටිනා මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු.175,796 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණද, ව්‍යාපෘතියේ කාර්යයන් ඉටුනොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය අවලංගු කර තිබුණු අතර මෙම මුදල ආපසු අයකර ගෙන නොතිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | **2014 දෙසැම්බර් 31** දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| ------------ | ----------- | ----------- | ----------- | ------------ | -------------- | ----------------- |
| | රු. | | | | රු. | |
| සැලසුමගම ග්‍රාමයට ජලය සැපයීම | 2,640,223 | 2012 .12.14 | 2013.03.14 | 2014.03.18 | 2,640,223 | හේතු දක්වා නොතිබුණි. |
| කොරන්ගුමලේ පාර ඉදිකිරීම | 1,341,754 | 2012.12.31 | 2013.03.15 | 2013.12.31 | 1,382,084 | අධික වර්ෂාව |
| එඬරුගොල්ල පාලම ඉදිකිරීම | 1,626,670 | 2012.07.23 | 2012.10.30 | 2014.05.27 | 1,696,807 | හේතු දක්වා නොතිබුණි. |
| ඉලුක්තැන්න වත්ත පහල කොටස කොන්ක්‍රීට් කිරීම | 557,151 | 2013.03.11 | 2013.05.11 | 2014.02.16 | 560,624 | අක්මුදල් ලබාදීමේ ප්‍රමාදය |
| රත්මලාන හින්දු විද්‍යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම | 12,947,837 | 2011.08.23 | 2012.08.23 | 2014.03.27 | 14,194,169 | නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම |

**(ඇ) කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

පහත සඳහන් ව්‍යාපෘති ඉකුත් වර්ෂයේදී ආරම්භ කළ යුතු වුවත්, එම ව්‍යාපෘති කාල පමාවකින් පසුව සමාලෝචිත වර්ෂයේදි ආරම්භ කර තිබුණි.

| ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කළ ආයතනය | ව්‍යාපෘති පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | ප්‍රමාද කාලය |
|---|---|---|---|---|
| | | රු. | | |
| ට්‍රිල්කුල්ට්‍රි ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය අලුත්වැඩියාව | වැවිලි මානව සංවර්ධන භාරය | 278,712 | 2013.07.12 | දින 192 |
| වටගොඩ වත්තේ කොටසකට සනීපාරක්ෂක පහසුකම් සැපයීම | -එම - | 566,115 | 2013.06.26 | දින 205 |

**(ඉ) කිසිදු ප්‍රතිපාදන උපයෝජනයක් සිදු නොකළ ව්‍යාපෘති**

ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අංශයේ කාර්යසාධන වාර්තාවට අනුව ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය යටතේ විවිධ උප ව්‍යාපෘති 31 ක් පළාත් පාලන ආයතන හා වැවිලි මානව සංවර්ධන භාරය මගින් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 28,956,377 ක ප්‍රතිපාදන සළසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් එම ව්‍යාපෘති සඳහා කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි.

## 3.12 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය**

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරකම් 10 ක් සඳහා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 514 ක් අනුමත කර තිබුණි. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලියන 360 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර රු.මිලියන 706 ක් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 527 ක් උපයෝජනය කර

තිබුණි. අනුමත කර තිබුණු ව්‍යාපෘති 514 කින් ව්‍යාපෘති 381 ක් නිම කර තිබුණු අතර, තවත් ව්‍යාපෘති 133 ක් අසම්පූර්ණව පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මේ කාල රාමුව අනුව එක් එක් කාර්යන්වල භෞතික හා මූල්‍ය කාර්යසාධන ඉටු කිරීම අධීක්ෂණය හා ඇගයීම් සඳහා වෙන් කරගෙන තිබූ මිලියන 1.8 ට අමතරව රු. මිලියන 3.8 ක්ද වැයකර තිබුණු අතර අවිච්ඡේද ව්‍යාපෘතිද ඇතුළුව 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 514 න් 381 ක් පමණක් අවසන් කර තිබුණි.

(ii) 2013 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් අවිච්ඡේද වැඩ පිළිබඳව මෙම වාර්තාවේ කිසිදු සටහනක් කර නොතිබුණි.

(iii) සකස්කර තිබුණු ක්‍රියාකාරී සැලැසුමෙහි ඇතුළත් විශේෂ ව්‍යාපෘති සඳහා රු.මිලියන 5 ක් වෙන්කර තිබුණද, ඒ යටතේ ඉටුකර තිබුණු කාර්යයන් කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි.

(iv) ටිල්කුල්ට්‍රි ප්‍රජා ශක්ති මධ්‍යස්ථානයේ අලුත්වැඩියාව හා නවීකරණය කිරීම ව්‍යාපෘතිය සඳහා අත්තිකාරම් ගෙවූ දින සිට දින 192 ක ප්‍රමාදයකින් පසු වැඩ ආරම්භ කර තිබුණු බැවින් ගෙවන ලද රු.55,309 ක අත්තිකාරම් මුදල නියෝජිත ආයතනයේ නිෂ්කාර්යව පැවතුණි. එසේම ගිවිසුම අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2.5 ක් රඳවාගෙන කොන්ත්‍රාත්තුව නිම වී මාස 06 පසු කොන්ත්‍රාත් කාර්යය නිසි ලෙස නිමකර තිබේද යන්න පරීක්ෂා කිරීමෙන් පසුව රඳවාගත් මුදල නිදහස් කළයුතු වුවත්, එසේ පරීක්ෂා කිරීමකින් තොරව කාර්ය අවසන් වී දින 55 න් පසු සම්පූර්ණ මුදලම නිදහස් කර තිබුණි.

(v) රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ තාප්පය අසල වැසි ජලය බැසයන කාණු පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු සමඟ වලංගු ගිවිසුමක් ඇතිකර ගත් බවට තොරතුරු අනාවරණය නොවූ අතර එම නිසා කොන්ත්‍රාත්තුව ආරම්භ කළ දිනය , අවසන් කළ යුතු දිනය, කොන්ත්‍රාත් වටිනාකම හා ගිවිසුම් කොන්දේසි හඳුනාගත නොහැකි විය. ඇස්තමේන්තු ගත රේටයන් හා ගෙවීම් වාර්තාවේ රේටයන් අතර ප්‍රමාණවත් වෙනස්කම් පැවති බැවින් රු.366,540 ක වැඩිපුර ගෙවීමක් අනාවරණය විය.

(vi) මස්කෙලිය සුසානාගාර ගොඩනැගිල්ල හා පිවිසුම් මාර්ගය ඉදිකිරිම සඳහා 2014 සැප්තැම්බර් 16 දින අත්තිකාරම් ලෙස රු.289,683 ක් ගෙවා තිබුණු අතර

ඉන්පසු කර්මාන්තයේ ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් ගොනුවේ ඇතුළත් කර නොතිබුණි. විගණන දිනය වූ 2015 මැයි 30 දින වන විට කර්මාන්තය අවසන් වී නොතිබුණු අතර ගොනුව අනුව ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමක් හෝ කර නොතිබුණු බැවින් එදිනට ප්‍රමාද ගාස්තු ලෙස සති 36 ක් සඳහා රු.91,224 ක් අයවිය යුතුව තිබුණි.

(vii) වැසිකිළි ඒකක 15 ක් වටගොඩ වතු යායේ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය 2013 සැප්තැම්බර් 26 දින දක්වා දින 90 ක් වී තිබුණු නමුත්, ඉන්පසු මෙම කාර්ය අවසන් කළ බවට කිසිදු තොරතුරක් ගොනුව අනුව අනාවරණය නොවූණි. මෙම කාර්යය අවසන් කළ යුතු දිනය 2014 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණු නමුත් මේ සඳහා ලබාගත් රු.113,208 ක අත්තිකාරම් මුදලක් දින 61 ක් වැවිලි මානව සංවර්ධන භාරයේ නිෂ්ක්‍රීයව තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු දිගුකලක් ප්‍රමාද වූ නමුත් වැවිලි මානව සංවර්ධන භාරයට මෙම ව්‍යාපෘතිය මෙහෙයවීම හා සුපරික්ෂණය සඳහා රු.33,966 ක් ගෙවා තිබීම ඵලදායීද යන්න විගණනයට ගැටලු සහගත විය.

**(ආ) පශු සම්පත් සංවර්ධන අංශය**

මෙම අංශය සඳහා සමාලෝචිත වර්ෂයේදී මුල් ඇස්තමේන්තුවෙන් රුමිලියන 1,441.20 වෙන්කර තිබුණු අතර ඒ අනුව සකස්කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පශු සම්පත් සංවර්ධන අංශයේ කාර්යසාධන වාර්තාව විගණනය වෙත ලබා නොදීම හේතුවෙන් එම ව්‍යාපෘති වල ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

සංශෝධිත ඇස්තමේන්තුවට අනුව මෙම අංශය සඳහා රුපියල් මිලියන 3,478 ක් ලැබී තිබුණද , එම මුදල උපයෝජනය කරගන්නා ආකාරය දැක්වෙන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරගෙන නොතිබුණි.

**(ඇ) සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපල සංවර්ධනය ව්‍යාපෘතිය**

සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මේ යටතේ ලැබී තිබුණු රු.මිලියන 20 ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරුන් වෙත බෙදාදී තිබුණු අතර එම ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ii) එක් කුකුළු පැටවෙකුගේ මිල රු.400 බව තීරණය කර තිබුණද උතුරුමැද පළාත් අධ්‍යක්ෂ වෙත කුකුළු පැටවවුන් 2770 ක් ලබා ගැනීම සඳහා එක් පැටවෙකුට රු.497 ක් බැගින් ගෙවා තිබුණි. ඒ අනුව කුකුළු පැටවුන් 2,770 ක් සඳහා රු.268,690 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) මහවැලි සත්ත්ව නිෂ්පාදන සමාගම විසින් වෙළඳපල අවශ්‍යතා සඳහා මස් තොග ගබඩාකර තබාගැනීම හේතුවෙන් ජීවී සතුන්ගේ ආහාර සැපයීමට සමාගම වෙත ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් සත්ත්ව ආහාර ලබාගැනීම සඳහා මෙම ව්‍යාපෘතියේ රු.1,055,770 ක මුදලක් අමාත්‍යාංශය මගින් සමාගම වෙත නිදහස් කර තිබුණි.

**(ඇ) සැලැසුම් කිරීම**

**-----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

-----------------------------------------------------------

ග්‍රාමීය ප්‍රජා සංවර්ධන හා පශු සම්පත් සංවර්ධන අංශයේ එක් එක් ව්‍යාපෘති බාණ්ඩ යටතේ සිදුකිරීමට අපේක්ෂිත උප ව්‍යාපෘති සංඛ්‍යාව හා අනෙකුත් විස්තර 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා නොතිබීම හා සංශෝධිත ඇස්තමේන්තු අනුව ක්‍රියාකාරී සැලැසුම් සංශෝධනය කරගෙන නොතිබීම හේතුවෙන් සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘතිවලට අදාල ප්‍රගතිය වාර්තා සමඟ සසඳා පරීක්ෂාකළ නොහැකි විය.

**3.13 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**------------------------------**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යවරයාගේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් විශේෂ කාර්ය බලකායේ සෙබල කණ්ඩායම් ප්‍රවාහනය කිරිම සඳහා යොදවා තිබූ ලැන්ඩ්රෝවර් ජීප් රථ දෙක අබලන් තත්ත්වයේ පවතින බැවින් නව ජීප් රථ දෙකක් මිලදී ගැනීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව එම අබලන් වාහන දෙක ඉවත් කිරීමටත් නව ජීප් රථ දෙකක් මිලදී ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අනුමැතිය ලබා දී තිබියදීත්, උක්ත අබලන් ජීප් රථ දෙක සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,652,292 ක් වැය කර තිබුණි.

(ආ) 2013 අගෝස්තු 23 දිනැති අංක BD/EE/140/08/2013 දරන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් අමාත්‍යවරයාගේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් ලැන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් රථ 02 ක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2013 සැප්තැම්බර් 13 දිනැති ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත රු.45,600,000 ක් වටිනා ලැන්ඩ් ක්‍රෘෂර් ප්‍රාඩෝ වාහන දෙකක් මිලදී ගෙන තිබුණි. ආරක්ෂණ කටයුතු සඳහා යොදවා ගැනීමට යෝජිත වාහන වෙනුවට වෙනත් වාහන මිලදී ගැනීම නිසා 2014 අගෝස්තු 14 දිනැති අංක BD/NS/190/03/01 දරන ජාතික අයවැය අධ්‍යක්ෂගේ ලිපියෙන් ලද අනුමැතිය මත නැවත වරක් ලැන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් රථ 02 ක් සඳහා 2014 වර්ෂයේදී රු.9,046,741 ක් වැයකර මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම වාහන දෙකෙන් එක් වාහනයක් පමණක් අමාත්‍යාංශයට ලැබී තිබුණු බැවින් වාහන මිලදී ගැනිමට අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

**3.14 පාඩු හා හානි**

----------------

2010 වර්ෂයේදී අනතුරට පත් රු.3,625,000 ක් වටිනා වාහනයක් අලුත්වැඩියා සඳහා 2010 නොවැම්බර් 11 දින ගරාජයකට බාරදී තිබුණද 2015 මැයි 11 දින වන විටත් එම වාහනය අළුත්වැඩියා කර අමාත්‍යාංශය වෙත ලබාගෙන නොතිබුණි.

**3.15 අනාර්ථික ගනුදෙනු**

-----------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන්, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම වාහන සංඛ්‍යාව 3 ක් වුවත්, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා වෙත වාහන 14 ක් හා ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත වාහන 05 ක්ද වශයෙන් වාහන 19 ක් වෙන්කර තිබුණි.

(ආ) කිලෝ මීටර් 38,420 ක් ධාවනකර තිබුණු ජනාධිපති ආරක්ෂක අංශයට අයත් වාහනයක් 2014 අගෝස්තු 29 දින සිට අමාත්‍යාංශයට ලබා දී තිබු අතර අමාත්‍යාංශය විසින් වාහනය භාරගෙන දින 02 කට පසු ටර්බෝ චාජරය අළුත්වැඩියා කිරීමට රු.446,827 ක් වැයකර තිබුණි.

(ඈ) කල්බදු පහසුකම යටතේ ලබාගෙන තිබූ වාහනයක් 2006 වර්ෂයේදී අමාත්‍යාංශයේ නීති උපදේශක වෙත අනුයුක්ත කර තිබුණු අතර 2006 වර්ෂයේ ඔහුගේ සේවය අවසන් වීමෙන් පසුවද එම වාහනය නැවත අමාත්‍යාංශය වෙත භාරදී නොතිබූ බැවින් අමාත්‍යාංශය විසින් 2008 වර්ෂයේ සිට කල්බදු වාරික ගෙවීම නවතා තිබුණි. 2012 වර්ෂයේ සිට නැවත වාරික ගෙවීම ආරම්භ කර තිබුණු අතර කල්බදු වාරික වෙනුවෙන් රු.7,432,095 ක් ගෙවා තිබූ අතර වාහනයේ තක්සේරු වටිනාකම රු.3,500,000 ක් වූයෙන් රු.3,932,095 ක් වැඩිපුර ගෙවා තිබුණි.

මෙම වාහනය වර්ෂ 05 ක පමණ කාලයක් බාහිර පුද්ගලයකු වෙතද වර්ෂයක පමණ කාලයක් කල්බදු සමාගමෙහිද රඳවා තබාගෙන තිබීමෙන් අමාත්‍යාංශයට වර්ෂ 06 ක් මෙම වාහනයෙන් සේවයක් ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර එසේ සේවය අහිමි වූ කාලය තුළදී අදාල පාර්ශවය වෙතින් කිසියම් අයකර ගැනිමක් හෝ ලබාගෙන නොතිබුණි.

## 3.16 කළමනාකරණ දුර්වලතා
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෞවනයින් රැකියාවලට පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ස්වයංරැකියා සැපයීමේ අරමුණෙන් වතුකරයේ තරුණ තරුණයින්ට ණය ලබාදීම පිණිස භ්‍රමණ අරමුදලක් ඇති කිරීම සඳහා රාජ්‍ය බැංකුවක රුපියල් දශලක්ෂයක් තැන්පත් කිරීමට 2000 අගෝස්තු 24 දින පැවැති අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අනුමත මුදල ඉක්මවා රු.300,000 ක් 2004 වර්ෂයේදී බැංකුවේ තැන්පත් කර තිබුණි.

(ii) දෙපාර්ශවය අතර ඇති කරගෙන තිබුණ ගිවිසුම් අනුව ණය ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් කර නොතිබුණි. ලංකා බැංකුවේ 2013 සැප්තැම්බර් 12 දිනැති ගිණුම් ප්‍රකාශය අනුව 2000 වර්ෂයේ සිට බැංකුවේ තැන්පත් කර තිබුණු මුදලින් ණය ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයන්ගෙන් අයවියයුතු රු.3,845,061 ක් බැංකුව විසින් තැන්පත් මුදලින් අඩුකරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට අවශ්‍ය ණයලාභීන්ගේ

ලැයිස්තුව, හිග හිටි ණය ප්‍රමාණය හා පුද්ලගයින් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණි.

(iii) 2011 වර්ෂයේදී ගිවිසුම අක්‍රියවීමෙන් නැවත බලාත්මක කර මෙම අරමුදලේ අරමුණ ඉටුකර ගැනීමට තැන්පතුව පවතින බැංකුව සමඟ හා වෙනත් රාජ්‍ය බැංකුවක් සමඟ විවිධ සාකච්ඡා පවත්වා තිබුණද, එකඟතා ගිවිසුමක් ඇති කර ගැනීමට 2015 ජූනි 15 දින වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(iv) බැංකුවෙන් ලැබෙන සියයට 02 ක පොළිය ලබාගැනීම හැර 2011 වර්ෂයේ සිට මෙම අරමුදලින් කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබූ අතර, අරමුදල ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කිසිදු ඉදිරි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අරමුදල මගින් ණයදීම පිළිබඳව වතුකරයේ තරුණ තරුණියන් දැනුවත් කළ බව විගණනයේදී තහවුරු වී නොතිබුණි.

(ආ) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 3.2 ඡේදය පරිදි ගරු අමාත්‍යවරයා, ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත වෙන්කර තිබෙන අතිරික්ත වාහන පිළිබඳව, ඒවා අමාත්‍යාංශයේ හෝ වෙනත් ආයතනවල අවශ්‍යතාවයන් සඳහා යොදාගැනීමට හැකිවනු පිණිස නොපමාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දිය යුතු වුවත් අමාත්‍යාංශය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) ජනාධිපති ලේකම් කාර්යාලය මගින් තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු වාහන 11 ක් 2010 වර්ෂයේ පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය වෙත භාර දී තිබූ අතර එම වාහන සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ හිමිකම් ලබාගෙන නොතිබුණි.

(ඈ) කල්බදු ක්‍රමය මත ලබාගත් වාහන හතර සඳහා වූ කල්බදු වාරික 2014 ජූලි මාසය වන විට ගෙවා අවසන් කර තිබුණද, එම වාහනවල ලියාපදිංචි සහතිකය හා පරම හිමිකාරත්වයට අදාල ලේඛන අමාත්‍යාංශය විසින් අදාල සමාගම වෙතින් ලබාගෙන නොතිබුණි.

(ඉ) 1989 දී පිහිටවා තිබුණු සීමාසහිත මහවැලි පශු සම්පත් සමාගම 2010 වර්ෂයේ සිට පශු සම්පත් ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කර තිබුණු අතර එම අවස්ථාවේදී සමාගම සතුව තිබුණු මූල්‍ය හා භෞතික සම්පත් පිළිබඳ විස්තර හා තත්ත්වය පිළිබඳ ඇගයීමක් අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි. එමෙන්ම 2005/2006 මුදල් වර්ෂය වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශන සඳහා අහිතකර මතයක් ප්‍රකාශකර තිබුණු අතර ඉන්පසු මූල්‍ය ප්‍රකාශන ස්වාධීන විගණකයෙකු විසින් විගණනය කර නොතිබුණි. බොහෝ පරිපාලන හා මූල්‍ය අක්‍රමිකතා සිදුවී තිබෙන බව 2014 පෙබරවාරි 20 දින පැවැත්වූ මහා සභා රැස්වීම් වාර්තාව අනුව නිරීක්ෂණය වූ අතර 2010 වර්ෂයේ සිට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ මෙම සමාගමේ මූල්‍ය තත්ත්වය හා භෞතික ක්‍රියාකාරකම් වර්ධනය කර ගැනීමට අමාත්‍යාංශා අපොහොසත් වී තිබුණි.

## 3.17 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 21 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 84 | 71 | 13 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 74 | 63 | 11 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 06 | 05 | 01 |
| | **එකතුව** | **196** | **164** | **32** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 32ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 4. ශීර්ෂ 292 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 4.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 45 ක හා සියයට 60 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 4.2 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.6,774,770 ක්වූ තැන්පතු 88 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 4.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් වර්ෂ 17 ක කාලයක සිට හිඟහිටව පැවැති රු.23,265 ක් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් වාර තුනක් පමණක් පවත්වා තිබුණි.

### 4.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

2004 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවති යතුරුපැදියක් අපහරණය කිරිමට කටයුතු කර නොතිතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**---------------------------------------------------------------**

බාහිර පාර්ශවයන්ට අයත්ව තිබුණු ඉඩම් ඒකක 19 ක් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

**4.6 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| **(i)** 1989 මාර්තු 23 දිනැති අංක 19/89 දරන චක්‍රලේඛය | එක් වරකදී මාසයකට වැඩි කාලයක් සඳහා අතිකාල දිමනා අනුමත නොකළ යුතු වුවත්, 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා සේවකයින් 163 දෙනෙකුට එකවර අතිකාල දිමනා අනුමත කර තිබුණි. |
| **(ii)** 1998 දෙසැම්බර් 30 දිනැති අංක 29/98 දරන චක්‍රලේඛයේ 4.8 ඡේදය | භාෂා ප්‍රවීනතාවය මත දිරි දීමනා ලබන නිලධාරීන්, දීමනාවකින් තොරව භාෂා පරිවර්තන කටයුතු සිදු කළ යුතු වුවත්, දිරි දීමනා ලබන නිලධාරිනියකට 2013 වර්ෂයේදී භාෂා පරිවර්තනය වෙනුවෙන් රු.77,277 ක් ගෙවා තිබුණි. |

**4.7** දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

දේශීය මුල්‍යකරණයන් යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සම්බන්ධවයන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් ව්‍යාපෘති නියමිත දින වන විට ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරික්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2014 දෙසැම්බර් 31 දින වනවිට වියදම |
|---|---|---|---|---|
| | රු. | | | රු. |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම උදෙසා වූ පර්යේෂණ ව්‍යාපෘතිය | 32,000,000 | 2014.01.01 | 2014.12.31 | 15,470,000 |
| පශු පර්යේෂණ ආයතනය තුළ කිරි තාක්ෂණ පරීක්ෂණාගාරයක් පිහිටුවීම | 15,000,000 | 2014.01.01 | 2014.12.31 | 7,560,000 |
| බුරුළු ප්‍රදාහ රෝග පාලන වැඩසටහන | 15,000,000 | 2014.01.01 | 2014.12.31 | 2,510,000 |
| සත්ව නිරෝධායන ඒකක ප්‍රසාරණය හා නවීකරණය | 14,000,000 | 2014.01.01 | 2014.12.31 | 2,080,000 |
| කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මගින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | 18,000,000 | 2014.01.01 | 2014.12.31 | 10,400,000 |

**(ආ) අසාර්ථක ව්‍යාපෘති**

දෙපාර්තමේන්තුව විසින් 2012 හා 2013 වර්ෂවලදී එකතුව රු.1,870,400 ක් වැය කර සීප්පුකුලම සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ජල පිරිපහදු ඒකකයක් ස්ථාපනය කර තිබුණි. එහෙත් අපේක්ෂා කළ පරිදි එම ජල පිරිපහදු මධ්‍යස්ථානයෙන් පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමට අසමත් වූ බැවින් 2015 මාර්තු මාසයේ සිට මසකට රු.15,000 බැගින් වැය කර පානීය ජලය ලබාගැනීමට කටයුතු කර තිබුණු අතර, ඒ සඳහා 2015 මාර්තු හා අප්‍රේල් මාසවල එකතුව රු.29,000 ක් වැය කර තිබුණි. එමෙන්ම 2015 ජූනි 10 දින වන විටද එම ස්ථාපනය කළ පිරිපහදුවෙන් පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

**4.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 169 | 134 | 35 |
| (ii) තෘතියික මට්ටම | 11 | 10 | 01 |
| (iii) ද්විතියික මට්ටම | 346 | 260 | 86 |
| (iv) ප්‍රාථමික මට්ටම | 351 | 297 | 54 |
| එකතුව | 877 | 701 | 176 |